| 3 වන වාර පරීක්ෂණය - 2009 | |
|---|---|
| 7 ශ්‍රේණිය | |
| නර්තනය - 1 කොටස | කාලය පැය 1 යි |
| නම:........................................................................................................ ශ්‍රේණිය............... අංකය................ | |

- සැලකිය යුතුයි : මකන දියර භාවිතය සම්පූර්ණයෙන් තහනම් වේ.
- 1 කොටසෙහි ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

අංක 01 සිට 05 දක්වා දී ඇති ප්‍රශ්න වලට අදාල පිළිතුරු හිස්තැන්හි දක්වන්න.

1) "දොම් කිත කිත දොම්"යන බෙරපදය අයත් තාල රූපය......................................නම් වේ

2) උඩරට නර්තන සම්ප්‍රදායයේ ගායන,නර්තන අංග යන්හි තිත පවත්වා ගැනීම සඳහා යොදාගන්නා ඝන වාදන භාණ්ඩය................................නම් වේ

3) ජන ජීවිතයේ විවිධ ක්‍රියාකාරකම් ඇසුරු කර ගනිමින් නිර්මාණය වී ඇති ගායනා............................නම් වේ

4) "ඉඳ ගත්තෙමි සොඳ පුටුවක ගුවනා"මෙය....................................කවියකි

5) "උඩ පල ගත්තත් වට්ටක්කා"ඉහත පද කොටස වාදනයට යොදාගන්නේ......................................යි

අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්නවලට හරි නම් √ ලකුණද වැරදි නම් X ලකුණද යොදන්න.

6) "තෙයිත තෙයිත තෙයි තෙයියත් තාම්"හතරවන පා සරඹයයි ( )

7) "රොන්තක ජිංතන තරිනිට බැංදත් තා"හස්තිරමකි ( )

8) "දොං ජිංත ගත දොංත"රබන් පදයකි ( )

9) නැටුම් ගැයුම් වැයුම් වලදී තාලය පවත්ගැනීම අත්‍යවශ්‍යය සාධකයකි ( )

10) තම දේශයේ අභිමානය පිළිබඳව අදහස් දක්වමින් ජාතික ගීය ගායනා කරනු ලැබේ ( )

අංක 11 සිට 20 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු තෝරා යාකරන්න.

| | |
|---|---|
| 11. "ඇහැළ මලින් ගස් පිරිලා" | සුළු මැදුම් දෙතිත |
| 12. දොං ජිංත ගත දොංත | ගැට බෙරය |
| 13. මිනිස් චරිතයකි | අවුල් හරය |
| 14. කොහොඹා කංකාරිය ශාන්ති කමයට යොදාගන්නා ප්‍රධාන වාදක භාණ්ඩය | වැද්දා |
| 15. වෙස් ඇඳුම් කට්ටලයේ එන කොටසකි | තාලානුකූල චලන ගීතයක මුල්පදයයි |

අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

16. ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ජාතික උත්සවය
    - I. නත්තල් උත්සවය
    - II. වෙසක් උත්සවය
    - III. නිදහස් උත්සවය
    - IV. සිංහල අවුරුදු උත්සවය

17. සිංහල අලුත් අවුරුදු සමයේ බහුල වශයෙන් ඇසෙන වාදන වර්ගයක් වන්නේ
    - I. තම්මැට්ටම් වාදනය
    - II. පංචතූර්ය වාදනය
    - III. මගුල් බෙර වාදනය
    - IV. බංකු රබන් වාදනය

18. මාත්‍රා 2+3 දෙතිත යනුවෙන් හඳුන්වන්නේ
    - I. සුළු තනි තිතයි
    - II. සුළු මැදුම් දෙතිතයි
    - III. මහ තනි තිතයි
    - IV. මැදුම් තනි තිතයි

19. “පේළි සැදී අඟනෝ සැරසිලා”මෙම ගායනයට අනුව නර්තනය ඉදිරිපත් කිරීමේදී යොදාගන්නා ප්‍රධාන රංග භාණ්ඩය වන්නේ
    - I. ගැට බෙරය
    - II. කළ ගෙඩිය
    - III. මෝල් ගස
    - IV. තාලම් පොට

20. සාම්ප්‍රදායික උඩරට නර්තනයේ විසිතුරු නැරඹිය හැකි අවස්ථාවක් වන්නේ
    - I. අවමංගල්‍ය උත්සවයකදී
    - II. තේවා වාදනයේදී
    - III. මහනුවර දළදා පෙරහැර
    - IV. කතරගම පෙරහැර

| |
|---|
| 3 වන වාර පරීක්ෂණය - 2009 |
| 7 ශ්‍රේණිය |
| නර්තනය - II කොටස | කාලය පැය 1 යි |
| නම:................................................................................................ ශ්‍රේණිය............... අංකය................. |

- දී ඇති ප්‍රශ්න 07 ක් ප්‍රශ්න 05 ක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

1.
   I. ගැමි නැටුම් 3 ක් නම් කරන්න.
   II. ගැමි නැටුම් සඳහා යොදාගන්නා රංග භාණ්ඩ 3 ක් නම් කරන්න.
   III. ඔබ ඉගෙන ගත් කුළු කවියක් ලියා දක්වන්න.
2.
   I. ඔබ විදුහලේ පෙරදිග තූර්ය වාදන කණ්ඩායමේ වාදනය කරනු ලබන වාද්‍ය භාණ්ඩ 5 ක් නම් කරන්න.
   II. කොහොඩාකංකාරිය ශාන්ති කර්මය ප්‍රචලිත ප්‍රදේශ 2 ක් නම් කරන්න.
   III. එම ශාන්ති කර්මයට යොදාගන්නා ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ඇඳ එහි කොටස් 5 ක් නම් කොට දක්වන්න.
3.
   I. තුරංගා වන්නමේ බෙරපදය සහ තානම ප්‍රස්ථාර ගතකරන්න.
   II. එම වන්නමේ එක් කවියක් සහ කස්තිරම ලියා දක්වන්න.
4.
   I. ඔබ ඉගෙන ගත් ලී කෙළි කවියක් සම්පූර්ණව ලියා දක්වන්න.
   II. ඔබ දන්නා ඔන්චිලි වාරම් කවියක් සම්පූර්ණව ලියා දක්වන්න.
5.
   I. ඔබ දන්නා රබන් පද 2 ක් ලියා දක්වන්න.
   II. පහත දැක්වෙන භාණ්ඩ ආතත,විතත,විතතාතත සහ සුසිර යන කොටස්වලට බෙදා ලියා දක්වන්න.
   ගැටබෙරය,බටනලාව,තාලම්පොට,දවුල,පත්තේරුව,හොරණෑව,තම්මැට්ටම,රබාන,යක්බෙරය, උඩැක්කිය
6.
   I. “අවකාශ භාවිතය”යන්න හඳුන්වන්න.
   II. අවකාශ භාවිතය ප්‍රධාන කොටස් කීයක් වේද?
   III. තාලානුකූල චලන ඉදිරිපත් කළ හැකි ගීතයක් ලියා දක්වන්න.
7.
   I. කොහොඹා කංකාරිය ශාන්ති කර්මයේ උපත් සභාව කෙටියෙන් ලියා දක්වන්න.
   II. ඔබ දන්නා ආශිර්වාද කවියක් ලියා දක්වන්න.
   III. ඔබ දන්නා නැළවිලි කවියක් ලියන්න.